// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1964/10 - 2016 අප්‍රේල් මස 26 වැනි අඟහරුවාදා - 2016.04.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද (2016 ජනවාරි 08 දින අංක 1948/60 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) 1984 ජනවාරි 24 දින අංක 281/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ ශ්‍රී ලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් වන ''විද්‍යා පීඨය'' යන සටහනට සහ 2 වැනි තීරයේ ඊට අනුරූප සටහන්වලට ඉක්බිතිවම, පහත දක්වෙන අයිතමය එකතු කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| *''1 වැනි තීරය* | *2 වැනි තීරය* |
|---|---|
| තාක්ෂණ පීඨය | 1. ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය<br>2. ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය<br>3. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය<br>4. බහුවිෂයයික අධ්‍යයනාංශය''. |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ දී ය.

05-200

1A - PG 2934— 508 (2016/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*